# ශ්‍රී ලංකා පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය

ඩී. එස්. සේනානායක පාර, කොළඹ 05, ශ්‍රී ලංකා.
දුරකථන / ෆැක්ස් : 2556629 වෙබ් අඩවිය : www.slpia.lk ඊ-මේල් : slpia@sltnet.lk


මගේ අංකය : එස්.එල්.පී.අයි.ඒ/බැහැර/116/20 ඔබේ අංකය :

2020.07.03

අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා,
අතිගරු ජනාධිපති,
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය,
ජනාධිපති කාර්යාලය,
කොළඹ 01.

**පොලිස් පරික්ෂක ශ්‍රේණියේ නිලධරයන්ගේ ගැටළු සම්බන්ධව.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ උන්නතිය වෙනුවෙන් ඔබ තුමා ගෙන යන ක්‍රියා මාර්ග සම්බන්ධව අප සංගමය ඉතා සතුටට පත් වන අතර ඒ සම්බන්ධව අපගේ සුභාසිංසන පිරිනමන්නට කැමැත්තෙමු.

ඔබ තුමා ජනාධිපතිවරයා ලෙස පත්වීමට ප්‍රථම පොලිස් පරික්ෂක වරුන්ගේ සංගමය දෙවරක් හමු වූ අතරම, ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා එක් වරක්ද, බැසිල් රාජපක්ෂ මැතිතුමා එක් වරක්ද, වශයෙන් හමු වී පොලිස් පරික්ෂක ශ්‍රේණියේ නිලධාරින් කාලයක සිට මුහුණ දෙනු ලබන ප්‍රශ්ණ සම්බන්ධව සාකච්ජා කරන ලදි. එහිදී පොලිස් පරික්ෂක ශ්‍රේණියේ නිලධාරින් මුහුණ දී ඇති ගැටළු කෙරෙහි ඔබ තුමාගේ අවධානය යොමු කරන ලද අතර ඔබ තුමා ජනාධිපතිවරයා ලෙස පත් වූ පසු එම ගැටළු වලට විසඳුම් ලබා දීමට කටයුතු කරන බව ප්‍රතිඥා දුන් අතරම ඉන් බොහොමයක් කරුණු ඔබ තුමාගේ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයේ ඇතුලත් කිරීම සම්බන්ධව අපගේ කෘතඥතාවය පුද කර සිටිමු.

ඒ අනුව පරික්ෂක ශ්‍රේණියේ නිළධරයන් විසින් දිගු කලක් තිස්සේ අත් විදින ගැටළු පහත පරිදි ඉදිරිපත් කර සිටිමු.

01. පොලිස් නිලධාරින් හට තම සේවා කාලය වසර 10 ක් ගත වන තුරු තම ස්ථිර පදිංචියට ආසන්න පොලිස් වසමකට ස්ථාන මාරුවීම් ලබා ගැනීමට නොහැකි අතර එම හේතුවෙන් ඔවුන් තම ස්ථිර පදිංචියෙන් දුර බැහැර පොලිස් ස්ථානයන්හි රාජකාරි කරනු ලබයි. දැනට ශ්‍රී ලංකා පොලිසියේ ප්‍රමාණවත් පරිදි නිළ නිවස්න නොමැතිවීම හේතුවෙන් බොහොමයක් විවාහක නිලධාරින් කුලී නිවාස වල පදිංචිව සිටින අතර ඇතැම් නිලධාරින් දෛනිකව තම ස්ථිර පදිංචි ස්ථානයේ සිට බොහෝ දුර ගෙවා රාජකාරි සඳහා පැමිණෙන අතරම ඇතැම් නිලධාරින් පොලිස් ස්ථානයන්හි පිහිටි සීමිත තනිකඩ හට නිවාසයන්හි රැඳී සිටි. එබැවින් නිලධාරින්ගේ රාජකාරි අවශ්‍යතාවය අනුව නිළ නිවාස ඇති කිරීම සහ දැනට කුලී නිවාසයන්හි පදිංචි නිලධරයන් හට ප්‍රමාණවත් කුලී නිවාස දීමනාවක් ලබා දීම.

02. පරික්ෂක ශ්‍රේණියේ නිලධරයන් බොහොමයක් රාජ්‍ය විශ්ව විද්‍යාලයන්හි මෙන්ම පෞද්ගලික විශ්ව විද්‍යාල හාහිර උපාධි පාඨමාලාවන් හදාරණු ලබන අතර ඒ සඳහා විශාල මුදලක් දැරීමට සිදුව ඇත. එබැවින් පරික්ෂක ශ්‍රේණියේ සෑම නිලධරයෙකු හටම උපාධියක් ලබා ගැනීමට හැකිවන ආකාරයෙන් ශ්‍රී ලංකා පොලිස් විශ්ව විද්‍යාලය ස්ථාපිත කිරීම සහ උපාධි පාඨමාලාවන් සහ පශ්චාත් උපාධි පාඨමාලාවන් සඳහා විදේශ ශිෂ්‍යත්ව ලබා දීම.

03. එක්සත් ජාතීන්ගේ සාම සාධක රාජකාරි සඳහා ශ්‍රී ලංකා පොලීසිය නියෝජනය කරමින් සහභාගී වන නිලධරයන්ගෙන් සාතිශය බහුතරය පොලිස් පරික්ෂක ශ්‍රේණියේ නිලධරයන් වේ. නමුත් 2016 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසන් සභාවේ නිශ්කාශණ වාර්ථා ලබා ගැනීමේ අවශ්‍යතාවය හේතුකොටගෙන සහ එම වාර්ථා කඩිනමින් ලබා නොදීම (දැනට මාස 14 තිස්සේ එම නිශ්කාෂණ වාර්ථා ලැබී නොමැත.) හේතුවෙන් 2018 වර්ෂයේ අග භාගයේ සිට කිසිදු පොලිස් නිළධාරියෙකුහට සාම සාධක රාජකාරි සඳහා නිරත වීමට නොහැකි වී ඇත. 2019 අප්‍රේල් මස සිට නිලධරයන් 69 දෙනෙකු එම රාජකාරිය සඳහා මූලික සුදුසුකම් ලබා ඇතත් මානව හිමිකම් කොමිසන් සභාවේ වාර්ථාව නොලැබීම හේතුවෙන් වසරක කාලයක් තුල ඇමරිකානු ඩොලර් 3,676,320.00 ක විදේශ විනිමයක් එනම් රුපියල් 685,999,531.95 ක විදේශ නිවිමයක් (දැනට පවතින විදේශ විනිමය අනුපාතය අනුව) අහිමි වී ඇත. එබැවින් වැඩි නිළධාරින් පිරිසක් එක්සත් ජාතීන්ගේ සාම සාධක රාජකාරි සඳහා යොමු කිරිමට කටයුතු කිරීම සහ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසන් සභාවේ නිශ්කාෂණ වාර්ථා කඩිනමින් ලබා දීමට ක්‍රමවේදයක් සකස්කර දීම.

04. විදේශ භාෂා හැසිරවීමේ හැකියාව සහ අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් සපුරා ඇති නිළධාරින් රාශියක් දැනට පරික්ෂක ශ්‍රේණියේ සිටින අතර ඔවුන් හට විදේශ දූත මණ්ඩල සේවයේ රාජකාරි කිරීම සඳහා අවස්ථාව ලබා දීම.

05. රාජ්‍ය සේවයේ සිටින උපාධිධාරි නිලදාරින් හට උපාධිධාරි දීමනාවක් ලැබෙන අතර පරික්ෂක ශ්‍රේණියේ හෝ ශ්‍රී ලංකා පොලිසියේ කිසිදු නිළධාරියෙකු හට එවැනි දිරි දීමනාවක් හෝ එම නිළධාරින්ගේ අධ්‍යාපනික සුදුසුකම් සඳහා සරිලන රාජකාරි ව්‍යුහයක් ලැබී නොමැත. එබැවින් පරික්ෂක ශ්‍රේණියේ උපාධිධාරි නිළධාරින් හට උසස්වීම් ලබා දීම සහ උපාධිධාරි දිරි දීමනාවක් ලබා දීම.

06. දැනට පොලිස් පරීක්ෂක ශ්‍රේණියේ උපාධිධාරීන් 370 ක් පමණ සිටින අතර, තරුණ උපාධි අපේක්ෂකයින් ද රාශියක් සිටී. එබැවින් දැනට ක්‍රියාත්මක වන සහකාර පොලිස් අධිකාරී තනතුර සඳහා ඉදුරා බඳවා ගැනීමේදී, අපරාධ විමර්ශනය, වැටලීම් රාජකාරී, රථවාහන රාජකාරී, සහ අධිකරණයේ නඩු මෙහෙයවීම සම්බන්ධ පරිචයක් ඇති පරීක්ෂක ශ්‍රේණියේ උපාධිධාරී නිළධාරීන් තුලින් පමණක් බඳවා ගැනීමට කටයුතු කිරීම.

07. පරීක්ෂක ශ්‍රේණියේ නිලධාරින් ස්ථානාධිපතිවරුන් වශයෙන් කටයුතු කිරිමේ දි සහ අනෙකුත් රාජකාරි කටයුතු වලදි ත්‍රිවිද හමුදා කොමිෂන් ලත් නිලධාරින් සමග සම්බන්ධතාවය ඇති කර ගැනිමේ දි , පරීක්ෂක ශ්‍රේණි නිලධාරින් අධිකාරි ලත් නිලයක් ලෙස නොසලකන බැවින් බොහෝ අවස්ථාවන්හි ගැටළුකාරි තත්වයන්ට මුහුණ දිමට සිදුව ඇත.

ඊට පිළියමක් ලෙස 1973 වර්ෂයේ සැප්තැම්බර් මස 19 දිනැති අංක 70 දරන සිරිමාවෝ බණ්ඩාරනායක අග්‍රාමාත්‍යවරියගේ අණ පරිදි නිකුත් කරන ලද පොලිස් ගැසට් පත්‍රයක් මගින් පොලිස් සේවයේ හා සන්නද්ධ සේවාවල අනුරූප තනතුරු සමීකරණය යටතේ "පොලිස් පරීක්ෂකවරුන් හා පොලිස් ස්ථාන භාර උප පරීක්ෂක වරුන් දැන් රාජ්‍ය නිවේදිත නිලධාරීන් වශයෙන් සලකන බවද, ඒ නිසා ඔවුන් සන්නද්ධ හමුදාවල පහළ ශ්‍රේණියේ අධිකාරි බලය ලත් නිලධාරින් හට සමාන තත්ත්වයක් දරන බවත් දක්වනු කැමැත්තෙමි" යනුවෙන් සඳහන්ව ඇත.

සියළුම පරික්ෂකවරුන් සහ ස්ථානභාර උප පරික්ෂකවරුන් රාජ්‍ය නිවේදිත තත්වයේ (අධිකාරි ලත් නිල තත්වය) ලා සැලකිය යුතු බව සඳහන් කර ඇතිමුත් එම ගැසට් පත්‍රය නිත්‍යානුකූලව අවලංගු වි නොමැති මුත් කාලයගේ ඇවෑමෙන් ඒ සම්බන්ධයෙන් වූ අවධානය ගිලිහී ඇත. එබැවින් පරික්ෂක ශ්‍රේණියේ නිලධාරින් හට රාජ්‍ය නිවේදිත තත්වය ලබා දිමට කටයුතු කිරිම.

08. ශ්‍රී ලංකා පොලිසියේ රාජකාරි නිරත සියළුම පොලිස් නිලධාරින් හට භෝජනාගාර දිමනාවක් නොලැබෙන බැවින් එම නිලධාරින්ට පෝෂ්‍යදායි ආහාර සඳහා විශාල වියදමක් දැරිමට සිදුව ඇත. එබැවින් දැනට ත්‍රිවිධ හමුදා නිලධාරින් හට ලබාදෙන ආකාරයේ ( Ration ) පෝෂ්‍යදායි ආහාර ලබා ගැනිමට සරිලන පරිදි භෝජනාගාර දිමනවාක් ලබා දිමට කටයුතු කිරිම.

ඉහත ඉල්ලීම් කෙරෙහි ඔබ තුමාගේ කාරුණික අවධානය යොමු කර ඒ සම්බන්ධව සාකච්ඡා කිරීම සඳහා අප සංගමය වෙත දිනයක් හා වේලාවක් ලබා දෙන මෙන් ඔබ තුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිමු.

ශ්‍රී ලංකා පොලිස් පරික්ෂකවරුන්ගේ සංගමයේ විධායක කමිටුව වෙනුවෙන්,

එස්. සංජය පෙරේරා,
ප්‍රධාන පොලිස් පරීක්ෂක,
සභාපති,
පොලිස් පරික්ෂක වරුන්ගේ සංගමය.

ගරු සභාපති
පොලිස් පරීක්ෂක සංගමය

ප්‍රගීත් ප්‍රේමසිරි,
නීතිඥ, නීතිවේදී (ගෞරව),
පොලිස් පරික්ෂක,
ලේකම්,
පොලිස් පරික්ෂක වරුන්ගේ සංගමය.

නීතිඥ ප්‍රගීත් ප්‍රේමසිරි
නීතිවේදී (ගෞරව)
ගරු ලේකම්,
ශ්‍රී ලංකා පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය